සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ සංඛ්‍යා ලේඛන නිලධාරි II ශ්‍රේණියට
බඳවා ගැනීමේ **විවෘත** තරග විභාගය - 2012


## (02) සාමාන්‍ය දැනීම

පැය එකයි

### විභාග අපේක්ෂකයින්ට උපදෙස්

**ඉතා වැදගත් :**

**පිළිතුරු ලිවීම සඳහා පැන්සල**
**භාවිත නොකරන්න.**



✳ ***පිළිතුරු සැපයීමේ දී පහත සඳහන් ආකාරයට ඉලක්කම් ලියා නැති උත්තර පත්‍ර ඇගයීමට ලක් නොකෙරේ.***

**1 2 3 4**

**ඔබේ විභාග අංකය මෙහි ද තුන්වෙනි පිටුවෙහි ඇති තිත් ඉර මත ද ලියන්න.**

.....................................

නිවැරදි බවට නිරීක්ෂකගේ
කෙටි අත්සන

.....................................

**වැදගත් :**

✳ *මෙම ප්‍රශ්න පත්‍රය* **I, II** *යනුවෙන් කොටස් දෙකකින් ද ප්‍රශ්න* ***50*** *කින් ද පිටු* ***06*** *කින්ද යුක්ත වේ.*

✳ *පිළිතුරු ලිවීමට පෙර ප්‍රශ්න පත්‍රය පිටු අංක අනුව සකසා ගන්න.*

✳ *ප්‍රශ්න* ***සියල්ලට ම*** *පිළිතුරු* ***මෙම පත්‍රයේ ම*** *සපයන්න.*

✳ *මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත කාලය* ***පැය එකකි.***

✳ *ශාලාධිපතිවරයා නිවේදනය කළ පසු පිළිතුරු ලිවීම ආරම්භ කරන්න.*

✳ ***දී ඇති උපදෙස් අනුව ම ප්‍රශ්නවලට පිළිතුරු සැපයිය යුතු වන අතර උපදෙස්වලට පටහැනිව සපයන පිළිතුරු සඳහා ලකුණු දෙනු නොලැබේ.***

✳ *ඔබට සැපයීමට පිළිතුරු නැතත් මෙම පිළිතුරු පත ශාලාධිපතිට භාර දිය යුතුය.*

✳ *ඔබේ පිළිතුරු පැහැදිලි ලෙස* ***නිල්*** *හෝ* ***කළු*** *හෝ පෑනෙන් පමණක් ලියන්න.* ***පැන්සල් පාවිච්චි නොකරන්න.***

✳ *මෙම ප්‍රශ්න පත්‍රය විභාග ශාලාවෙන් පිටතට ගෙන යාම හෝ එහි ඡායා පිටපත් ගැනීම හෝ වරදකි.*

✳ ***අපැහැදිලි ඉලක්කම්, අපැහැදිලි අත් අකුරු සහිත, මකන දියර භාවිත කරන ලද හා පැන්සලෙන් පිළිතුරු සපයන ලද පිළිතුරු පත්‍ර ඇගයීමට ලක් නොකෙරේ.***

**පරීක්ෂකගේ ප්‍රයෝජනය සඳහා පමණි**

| පිටුව | ප්‍රශ්න අංකය | ලැබූ ලකුණු |
|---|---|---|
| 2 | 1 - 10 | |
| 3 | 11 - 20 | |
| 4 | 21 - 30 | |
| 5 | 31 - 41 | |
| 6 | 42 - 50 | |
| **එකතුව** | | |

**අවසාන ලකුණු**

| | |
|---|---|
| ඉලක්කමෙන් | |
| අකුරින් | |

| | |
|---|---|
| උත්තර පත්‍ර පරීක්ෂක | |
| ලකුණු පරීක්ෂා කළේ | |

[ 2 වැනි පිටුව බලන්න.

## I කොටස

- අංක **1** සිට **30** තෙක් එක් එක් ප්‍රශ්නයට දී ඇති පිළිතුරු හතර අතුරින් **නිවැරදි** හෝ **වඩාත් ගැළපෙන** පිළිතුර තෝරා එහි **අංකය තිත් ඉර මත** ලියන්න.

1. මෙම වර්ෂයේ පැවැත් වූ සංගණනය අනුව ශ්‍රී ලංකාවේ ජනගහනය මිලියන
   (1) 19.2 කට මදක් වැඩි ය. (2) 20.2 කට මදක් වැඩි ය.
   (3) 21.2 කට මදක් වැඩි ය. (4) 22.2 කට මදක් වැඩි ය. (.........)

2. කොළඹ පාරිභෝගික මිල දර්ශකයෙහි ආරම්භක පදනම් වර්ෂය කුමක් ද?
   (1) 1948 (2) 1952 (3) 1956 (4) 1972 (.........)

3. සංචාරක කර්මාන්තය විශාල වශයෙන් දියුණුවෙමින් පවත්නා දිස්ත්‍රික්කය කුමක් ද?
   (1) මඩකලපුව (2) යාපනය (3) රත්නපුරය (4) අනුරාධපුරය (.........)

4. ශ්‍රී ලංකාවේ හබයාස් කෝපුස් (Habeas Corpus) ආඥාවක් නිකුත් කිරීමට බලය ඇත්තේ
   (1) දිස්ත්‍රික් උසාවියට ය.
   (2) මහාධිකරණයට ය.
   (3) අභියාචනාධිකරණයට ය.
   (4) ශ්‍රේෂ්ඨාධිකරණයට ය. (.........)

5. ශ්‍රී ලංකාවේ දරුවන් පාසල් යා යුතු අනිවාර්ය වයස් කාණ්ඩය මින් කුමක් ද?
   (1) අවුරුදු 5 - 12 (2) අවුරුදු 5 - 13 (3) අවුරුදු 5 - 14 (4) අවුරුදු 5 - 15 (.........)

6. ශ්‍රී ලංකාවේ සංස්කෘතික කටයුතු පිළිබඳව අමාත්‍යාංශයක් ආරම්භ වූයේ වර්ෂ
   (1) 1948 දී ය. (2) 1956 දී ය. (3) 1960 දී ය. (4) 1972 දී ය. (.........)

7. විදේශ විනිමය අනුපාතය අනුව ශ්‍රී ලංකා රුපියල් වැඩිම ගණනක් ලබාගත හැක්කේ මින් කුමන මුදල් වර්ගයට ද?
   (1) ස්ටර්ලින් පවුමට ය. (2) ඇමෙරිකානු ඩොලරයට ය.
   (3) ඕස්ට්‍රේලියානු ඩොලරයට ය. (4) කැනේඩියානු ඩොලරයට ය. (.........)

8. උතුරු පළාතේ තල් වගාව ආරම්භ කළේ
   (1) මලබාර්වරුන් විසිනි. (2) පෘතුගීසීන් විසිනි.
   (3) ලන්දේසීන් විසිනි. (4) බ්‍රිතාන්‍යයන් විසිනි. (.........)

9. "උතුරු - මිතුරු" වැඩසටහනේ ප්‍රධාන ව්‍යාපෘතියක් වන්නේ
   (1) දුම්රිය මාර්ගය දීර්ඝ කිරීම ය.
   (2) පානීය ජලය සැපයීම ය.
   (3) තරුණයන්ට රැකියා පුහුණුවීම් ලබාදීම ය.
   (4) කෘෂිකර්මය දියුණු කිරීම ය. (.........)

10. ශ්‍රී ලංකාවේ තේ කර්මාන්තය පිළිබඳ **සාවද්‍ය** ප්‍රකාශය කුමක් ද?
    (1) වර්ෂ 1824 දී චීනයෙන් ගෙනෙන ලද ප්‍රථම තේ පැළය පේරාදෙණිය උද්භිද උද්‍යානයේ රෝපණය කරන ලදී.
    (2) වර්ෂ 1867 දී ජේම්ස් ටේලර් විසින් ලූල්කඳුර වත්තේ අක්කර දහනවයක තේ වගා කරන ලදී.
    (3) වර්ෂ 2011 දී ප්‍රථමවරට ශ්‍රී ලංකා තේ මෙට්‍රික් ටොන් තුන්ලක්ෂයක් නිපදවන ලදී.
    (4) වර්ෂ 2011 දී වැඩිම තේ ප්‍රමාණයක් යුරෝපා සංගමය විසින් මිලයට ගන්නා ලදී. (.........)

[ 3 වැනි පිටුව බලන්න.

11. ජෝර්ජ් කීට් (George Keyt 1901 - 1993) යනු ශ්‍රී ලංකාවේ විසූ ශ්‍රේෂ්ඨ
(1) සංගීතඥයෙකි.
(2) චිත්‍ර ශිල්පියෙකි.
(3) නාට්‍යකරුවෙකි.
(4) ඉතිහාසඥයෙකි. (.........)

12. බයිලා සහ කපිරිඤ්ඤා සංගීත ක්‍රම මෙරටට හඳුන්වා දෙන ලද්දේ
(1) පෘතුගීසීන් විසිනි.
(2) මලබාර්වරුන් විසිනි.
(3) ලන්දේසීන් විසිනි.
(4) බ්‍රිතාන්‍යයන් විසිනි. (.........)

13. පෘතුගීසි, ලන්දේසි සහ බ්‍රිතාන්‍ය පාලන සමයේ පොදු ලක්ෂණයක් **නොවූයේ** මින් කුමක් ද?
(1) ඔවුනොවුන්ගේ ආගම් ව්‍යාප්ත කිරීම
(2) ආර්ථික වගා කිහිපයක් ආරම්භ කිරීම
(3) දේශීය සංස්කෘතිය පිළිබඳව සැලකිලිමත් නොවීම
(4) කීකරු පාලිත පන්තියක් බිහි කිරීම (.........)

14. ශ්‍රී ලංකාවේ කම්කරු ව්‍යාපාරයේ ආරම්භකයා වූයේ කවුද?
(1) ඒ. ඊ. ගුණසිංහ මහතා
(2) ආචාර්ය ඇන්. ඇම්. පෙරේරා මහතා
(3) බාලා තම්පො මහතා
(4) ඒ. ඇම්. ඇම්. අෂීස් මහතා (.........)

15. මෙරට වෛද්‍ය ක්ෂේත්‍රය සම්බන්ධ ප්‍රකට රජතුමා වන්නේ කවරෙක් ද?
(1) එළාර රජතුමා
(2) බුද්ධදාස රජතුමා
(3) සිරිසඟබෝ රජතුමා
(4) ධාතුසේන රජතුමා (.........)

16. 'එක් පවුලකට එක් ළමයෙක්' නමැති ප්‍රතිපත්තිය අනුගමනය කරනු ලබන ආසියානු රට මින් කුමක් ද?
(1) සිංගප්පූරුව (2) චීනය (3) මලයාසියාව (4) ජපානය (.........)

17. ලෝකයේ **වැඩියෙන් ම** රත්රන් නිපදවන රට මින් කුමක් ද?
(1) චීනය
(2) ඇමෙරිකා එක්සත් ජනපදය
(3) ඕස්ට්‍රේලියාව
(4) දකුණු අප්‍රිකාව (.........)

18. එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ආරක්ෂක මණ්ඩලයට අයත් **එකම** ආසියානු රට වන්නේ
(1) ඉන්දියාව ය.
(2) චීනය ය.
(3) ජපානය ය.
(4) තායිලන්තය ය. (.........)

19. පුද්ගලයකු ජාත්‍යන්තර දින රේඛාව හරහා යාමේ දී දිනයක් එකතු වන්නේ
(1) උතුරේ සිට දකුණට ගිය විට ය.
(2) නැගෙනහිර සිට බටහිරට ගිය විට ය.
(3) බටහිර සිට නැගෙනහිරට ගිය විට ය.
(4) දකුණේ සිට බටහිරට ගිය විට ය. (.........)

20. "මට ස්වප්නයක් තිබේ." නමැති සුපතළ ප්‍රකාශය කළේ
(1) මහත්මා ගාන්ධිතුමා ය.
(2) කාල් මාක්ස් ය.
(3) මාටින් ලූතර් කිං ය.
(4) ලියෝ ටෝල්ස්ටෝයි ය. (.........)

[ 4 වැනි පිටුව බලන්න.

21. මළ භාෂාවක් ලෙස සැලකෙන භාෂාවක් රාජ්‍ය භාෂාව වශයෙන් භාවිත කරන රට කුමක් ද?
(1) ඊජිප්තුව (2) ඉරානය
(3) ඉරාකය (4) ඊශ්‍රායලය (.........)

22. එක්සත් ජාතීන්ගේ සරණාගත කටයුතු පිළිබඳ ආයතනය කුමක් ද?
(1) UNITAR (2) UNIDR
(3) UNHCR (4) UNDRC (.........)

23. කථකලී නැටුම් ක්‍රමය අයත් වන්නේ
(1) කේරළයට ය.
(2) කර්ණාටකයට ය.
(3) බෙන්ගාලයට ය.
(4) ආන්ද්‍රා ප්‍රදේශයට ය. (.........)

24. ඔලිම්පික් ධජයේ මහාද්වීප පහ නියෝජනය වන පාට **පහ ම** දැක්වෙන්නේ කිනම් පේළියේ ද?
(1) නිල්, කහ, කළු, කොළ, රතු
(2) නිල්, කහ, කළු, කොළ, සුදු
(3) නිල්, කහ, කළු, කොළ, දුඹුරු
(4) නිල්, කහ, කළු, කොළ, අළු (.........)

25. පරිසරය ශබ්ද දූෂණ තත්ත්වයට පත්වෙතැයි සලකනු ලබන්නේ ශබ්දය මීත් කුමන ඩෙසිබල් සංඛ්‍යාව ඉක්ම වූ විට ද?
(1) 75 (2) 80 (3) 85 (4) 90 (.........)

26. 'මිනිසා ස්වභාවධර්මය ජයගත යුතුය' නමැති දර්ශනය ඇතුළත්ව ඇත්තේ
(1) බටහිර දර්ශනයෙහි ය.
(2) භාරතීය දර්ශනයෙහි ය.
(3) චීන දර්ශනයෙහි ය.
(4) රුසියානු දර්ශනයෙහි ය. (.........)

27. තිරසර සංවර්ධනය හා පරිසරය සංරක්ෂණය කිරීම සඳහා ස්වකීය රටේ එකතු වන ලෝහ අපද්‍රව්‍යවලින් 79% ක් ද වීදුරුවලින් 95% ක් ද ඇලුමිනියම්වලින් 90% ක් ද බැටරි අපද්‍රව්‍යවලින් 65% ක් ද ප්‍රතිචක්‍රීය කරනු ලබන යුරෝපීය රට කුමක් ද?
(1) ස්වීඩනය (2) ස්විට්සර්ලන්තය
(3) නෝර්වේ (4) ඩෙන්මාර්කය (.........)

28. කිරිවල අඩංගු ස්වාභාවික සීනි වර්ගය මින් කුමක් ද?
(1) මෝල්ටෝස් (Maltose) (2) ලැක්ටෝස් (Lactose)
(3) ෆ්‍රැක්ටෝස් (Fructose) (4) සුක්රෝස් (Sucrose) (.........)

29. ජීවිතයට තර්ජනයක් වූ විට ශරීරය තුළ නිපදවෙන හෝර්මෝනය කුමක් ද?
(1) ඉන්සියුලින් (Insulin) (2) තයිරොක්සින් (Thyroxine)
(3) ඇඩ්රිනලින් (Adrenaline) (4) මෙලටොනින් (Melatonin) (.........)

30. මෝල්තස්ගේ සිද්ධාන්තය (Malthusian theory) යනු
(1) මානව පරිණාමය පිළිබඳ සිද්ධාන්තයයි.
(2) ජනගහන වර්ධනය පිළිබඳ සිද්ධාන්තයයි.
(3) මානව විද්‍යාව පිළිබඳ සිද්ධාන්තයයි.
(4) පැස්චරීකරණය පිළිබඳ සිද්ධාන්තයයි. (.........)

## II කොටස

- අංක **31** සිට **50** තෙක් එක් එක් ප්‍රශ්නයට අදාළ පිළිතුර දී ඇති, **තිත් ඉර මත** ලියන්න.

31. ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව අයත් වන්නේ කුමන අමාත්‍යාංශයට ද?

..............................................................................................................................................

32. මෙම වර්ෂය අවසාන වන විට ශ්‍රී ලංකාව අපේක්ෂා කරනු ලබන ඒක පුද්ගල ආදායම ඇමෙරිකානු ඩොලර් කීයද?

..............................................................................................................................................

33. ශ්‍රී ලංකාවේ නවෝත්පාදන ප්‍රවර්ධනය සඳහා පිහිටුවා ඇති ආයතනය නම් කරන්න.

..............................................................................................................................................

34. ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික ලෙස රබර් වගා කරනු ලබන පළාත්වලින් බැහැරව ප්‍රථමවරට රබර් වගාව ආරම්භ කිරීමට බලාපොරොත්තු වන්නේ කුමන පළාතේ ද?

..............................................................................................................................................

35. ශ්‍රී ලංකාවේ ගම්මිරිස් වගා කරනු ලබන ප්‍රධාන දිස්ත්‍රික්ක තුනක් ඇත. ඉන් **එකක්** නම් කරන්න.

..............................................................................................................................................

36. හයමසක් ඇතුළත ශ්‍රී ලංකාවේ සෑම ග්‍රාම නිලධාරි කොට්ඨාසයක ම එක් නිවාසය බැගින් ඉදිකිරීම ආරම්භ කොට ඇත. මේ අනුව ඉදිකරනු ලබන නිවාස ගණන දළ වශයෙන් කීයක් වේ ද?

..............................................................................................................................................

37. ශ්‍රී ලංකා තේ පර්යේෂණායතනය පිහිටුවා ඇත්තේ කුමන ස්ථානයේ ද?

..............................................................................................................................................

38. 'නැගෙනහිර උදාව' සංවර්ධන වැඩපිළිවෙළ යටතේ ආයෝජනය කරනු ලබන්නන්ට දෙනු ලබන බදු සහන කාලය වර්ෂ කීයද?

..............................................................................................................................................

39. ශ්‍රී ලංකාවේ භූ කම්පන නියාමන මධ්‍යස්ථානය පිහිටුවා ඇත්තේ කුමන ස්ථානයේ ද?

..............................................................................................................................................

40. ශ්‍රී ලංකාව ජනරජයක් බවට පත්වූ වර්ෂය කුමක් ද?

..............................................................................................................................................

41. බ්‍රිතාන්‍යය හා ආර්ජෙන්ටිනාව අතර හටගෙන ඇති අමනාපයට හේතුවී ඇත්තේ කුමක් ද?

..............................................................................................................................................

[ 6 වැනි පිටුව බලන්න.

42. 2012 වසර අගදී ලෝක විනාසයක් සිදුවන බවට ඇතැම් අය උපකල්පන කරනු ලබන්නේ කුමන පැරණි දින දර්ශනයක් පදනම් කොට ගෙන ද?

.......................................................................................................................................

43. කාලයක් තිස්සේ චීනයේ මානව අයිතිවාසිකම් තත්ත්වය විවේචනයට භාජන කරමින් සිටින රට නම් කරන්න.

.......................................................................................................................................

44. මහත් ආන්දෝලනයට පත්ව ඇති දකුණු ඉන්දියාවේ ගොඩනගනු ලබන න්‍යෂ්ටික විදුලි බලාගාරය නම් කරන්න.

.......................................................................................................................................

45. ජාත්‍යන්තර පොලීසිය හඳුන්වනු ලබන්නේ කුමන නමකින් ද?

.......................................................................................................................................

46. ලෝකයේ විශිෂ්ටතම සිනමා කෘතීන් සඳහා පිරිනමනු ලබන සම්මාන හඳුන්වනු ලබන්නේ කුමන නමකින් ද?

.......................................................................................................................................

47. ලෝකයේ විශාලතම දුරේක්ෂය තැනීම සඳහා රටවල් දෙකක් එක්ව ක්‍රියා කරමින් සිටී. ඉන් **එක්** රටක් නම් කරන්න.

.......................................................................................................................................

48. රුසියානු අභ්‍යවකාශ ඒජන්සිය (Space Agency) නම් කරන්න.

.......................................................................................................................................

49. නව ස්ටීව් ජොබ්ස් (Steve Jobs) කෙනෙකු වශයෙන් සලකනු ලබන Facebook නිර්මාතෘවරයා කවුද?

.......................................................................................................................................

50. බ්‍රිතාන්‍ය සංඛ්‍යා ක්‍රමයට අනුව එක් ට්‍රිලියනයකට අයත් බින්දු සංඛ්‍යාව කීයද?

.......................................................................................................................................

* * *